**ශීර්ෂය 184 - පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 විගණන විෂය පථය

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

.

**(අ) විසර්ජන ගිණුම**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.769,275,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.504,925,676 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.264,349,324 ක් හෙවත් සියයට 34 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 562,475,000 | 431,562,823 | 130,912,177 | 23.27 |
| මුලධන | 206,800,000 | 73,362,853 | 133,437,147 | 64.52 |
| **එකතුව** | **769,275,000** | **504,925,676** | **264,349,324** | **34.36** |

**(ii) අයවැය විචලනය**

---------------------

වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.2,917,444 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

--------------------------------------------

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයට අදාල විෂය අංක 18401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18401 | 2,000,000 | 650,250 | 600,000 | 855,546 | 5,500,000 | (205,296) |

**(ඇ) අග්‍රිම ගිණුම**

වැඩ තහනමට ලක්වි සිටි නිලධාරියෙකු සම්බන්ධයෙන් අධිකරණයේ පවරා ඇති නඩුවක් අවසන් වී නොමැති නිසා ඔහුගෙන් අයවිය යුතු රු.2,520 ක අත්තිකාරම් මුදල අයකර ගැනිමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කපා හැරිමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 අගෝස්තු 31 දින පිළියෙල කර තිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් පිළිබඳව කරන ලද නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරිම**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය පිහිටුවීම සඳහා කොමිෂන් සභාව විසින් රු.2,977,179 ක් වැයකර ඉදිකළ ගොඩනැගිල්ල අමාත්‍යවරයාගේ දිස්ත්‍රික් කාර්යාලය හා සංචාරක නිවාසයක් ලෙස භාවිතයට ගන්නා බව නිරික්ෂණය විය. මේ නිසා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට තම දිස්ත්‍රික් කාර්යාලය පිහිටුවිමට නොහැකි වී තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා අමාත්‍යාංශය විසින් 2013 වර්ෂය තුළදි ජලය, විදුලිය, දුරකථන හා පුවත්පත් වෙනුවෙන් රු. 476,603

ක් වැය කර තිබුණි. තවද, මෙම දිස්ත්‍රික් කාර්යාලය මසක් ඇතුළත පිහිටුවන බව 2014 මාර්තු 06 දින ජාතික ගමනාගමන කොමිෂන් සභාව සම්බන්ධයෙන් පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කළද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යාල පිහිටුවා නොතිබුණි. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා දිස්ත්‍රික් කාර්යාලය විවෘත කිරීම ප්‍රමාද වී ඇති බවත්, දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී ඇති බැවින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසු මෙම කාර්යාලය විවෘත කරන බවත් ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පශු සම්පත් අමාත්‍යාංශයට අයත් වාහනයක් පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ කටයුතු සඳහා භාවිතා කර තිබුණත්, 2014 ජූලි 15 දින වන විටත් එම වාහනයේ අයිතිය පවරා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. මෙම වාහනයේ නඩත්තු හා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.234,944 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 2,917,444 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පිළියෙල කරන ලද කාල විශ්ලේෂණය අනුව එම ශේෂ වර්ෂයකට වඩා අඩු කාලසීමාවකට අදාල විය.

## 1.6 කාර්යසාධනය

අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂය තුළදි ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියක් සකස් කර අවසන් කළ යුතු වුවත්, 2014 මැයි මාසය අවසන් වන විටත් එය අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. පිළියෙල කරන ලද කෙටුම්පත සංශෝධනය සඳහා අමාත්‍යාංශය විසින් අදහස් හා යෝජනා 2014 අගෝස්තු 01 දින ප්‍රවාහන අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණු අතර, එකඟතාවය පළකල පසු ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන බව අමාත්‍යාංශයේ ලේකම්වරයා දන්වා තිබුණි.

(ii) ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට යම් යම් සංශෝධන ඇතුළත් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණද, 2014 නොවැම්බර් මස අවසන් වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. නීතිපතිගේ උපදෙස් ලැබුණු වහාම සංකල්ප පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන බව ලේකම්වරයා දන්වා තිබුණි.

(iii) යෝජිත බකමූණ බස් පර්යන්තය 2012 වර්ෂය තුළදි ඉදිකිරිමට නියමිත ව්‍යාපෘතියක් වූ අතර එය ක්‍රියාත්මක නොවූ නිසා 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැළැස්මට ඇතුළත් කර තිබුණද එය එම වර්ෂයේදි ද ආරම්භ කර නොතිබුණි. 2014 වර්ෂයේ ක්‍රියාකාරි සැළසුමෙන් එය ඉවත් කර තිබුණි.

(iv) ගලේවෙල හා පුඩළුඔය බස් පර්යන්තය 2013 වර්ෂයේදි ඉදිකිරිමට යෝජිතව තිබු නමුත් ඊට අදාළ ඉඩම සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය නොවීම නිසා ඉදිකිරිම ආරම්භ කර නොතිබුණි.

(v) මගී ආවරණ 8 ක් සමාලෝචිත වර්ෂය තුළදි ඉදිකිරිම සඳහා සැලැසුම් කර ඒ සඳහා රුපියල් මිලියන 2 ක් වෙන්කර තිබුණද කිසිදු මගී ආවරණයක් ඉදිකර නොතිබුණි.

(vi) 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව වර්ෂය තුළ උපාධිධාරින් 15 දෙනකු හා කළමනාකරණ සහායකයින් 15 දෙනකු පුහුණු කිරිම සඳහා සැලැසුම් කර තිබුණද කිසිදු සේවකයකු පුහුණුව සඳහා යොමුකර නොතිබුණි.

## 1.7 පාඩු හා හානි

----------------

අමාත්‍යාංශයට අයත් වාහනයක් 2013 අගෝස්තු 13 දින අනතුරට පත්වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) (3) ප්‍රකාරව ප්‍රාරම්භක පරික්ෂණ ආරම්භ කර නොතිබුණි. සිදුවී තිබුණු රු.4,704 ක පාඩුව විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි. මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 05 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 34 | 19 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 15 | - |
| | එකතුව | 59 | 39 | 20 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.